Marine Environment Protection Authority

# සත් සමුදුර 2017

ISBN 2279-3208

Pages 9-13

## ජාත්‍යන්තර නාවික කර්මාන්තය සහ මානව සම්පත් කළමනාකරණ ගැටළු

ආචාර්ය ලලිත් එදිරිසිංහ
සහය පීඨාධිපති
**CINEC** නාවික විශ්ව විද්‍යාලය
මාලඹේ

### 1. හැඳින්වීම

ශ්‍රී ලංකාව දිවයිනක් ලෙස නාවික ගමනාගමන සංධිස්ථානයක පිහිටීම නිසා මෙන්ම නාවික කර්මාන්තය ශ්‍රී ලාංකිකයන්ට නුපුරුදු දෙයක් නොවේ. එහෙත් දිනෙන් දින ඉහළ යන ජාත්‍යන්තර ඉල්ලුමට සරිලන පරිදි නාවික මානව සම්පත් සැපයීමේදී ශ්‍රී ලංකාව සංසන්දනාත්මකව එහි ඵල නෙලා ගන්නවාද යන්න සැක සහිතය. මෙම ලිපියේ විෂය මූලික අරමුණ වන්නේ නාවික කර්මාන්තයට අදාල වන මානව සම්පත් සම්බන්ධව මේ වන විට ලෝකයේ පවතින නැඹුරුව කෙසේදැයි සලකා බැලීමයි. දෙවනුව මේ කාර්යය සඳහා එකී අධ්‍යයන හා පුහුණු කිරීමේ ආයතනවලට ඇති වගකීම ගැන විවරණයක් කිරීමය.

ඕනෑම පාඨමාලාවක සාර්ථකත්වය රඳා පවතින්නේ ඒ සඳහා ඇති ඉල්ලුම මතය. මෙම ඉල්ලුම ඇතිවීමට බලපාන ප්‍රධාන කරුණක් වන්නේ පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසු සමාජයේ එම සුදුසුකම් ලාභියාට ඇති පිළිගැනීම හා විභව්‍ය රැකියා අවස්ථා මතය. මෙම රැකියා අවස්ථා වලද ගුණාත්මක අගය පිළිබඳ පූර්ව විශ්ලේෂණයක් අදාළ සිසුන් සහ දෙමව්පියන් විසින් සිදුකරන බැවින් රැකියාවේ කායීය ස්වභාවය, වේතනය, සමාජමය පිළිගැනීම, පුද්ගල සෞඛ්‍යය සම්බන්ධ කරුණු, කායීය ස්ථානය (ගොඩබිම, මුහුද, අහස, කර්මාන්ත ශාලා, කාර්යාල) යන කරුණු ඉමහත්ව බලපායි.

### 2. ප්‍රශ්නාර්ථය හා පර්යේෂණ පරමාර්ථය

නැවක කපිතාන් වරයෙකු යනු අවිවාදයෙන්ම ඉතා ඉහළ මට්ටමේ පිළිගැනීමක් ඇති වෘත්තියකි. එක්තරා අයුරකින් මෙය වික්‍රමාන්විත ක්‍රියාවක් ලෙස හා නවතම අත්දැකීම් සොයා යන වෘත්තියක් වශයෙන් සලකන බැවින් බොහෝ දුරට තාරුණ්‍යයේ අභියස සිටින පිරිමි ළමුන් මෙවැනි රැකියාවකට පෙළඹෙන බව සාමාන්‍ය මතයයි. කෙසේ වෙතත් මෙම රැකියාවේ අවදානම් සහිත බවක් ද නැතුවා නොවේ. මෑත කාලයේ සෝමාලියන් මුහුදු කොල්ල කරුවන්ගේ සිද්ධිය එක් උදාහරණයකි. ප්‍රශ්නයේ බාහිර ලක්ෂණ එසේ වුවත් මීට වඩා හාත්පසින් වෙනස් තත්වයක් වෙනත් පර්යේෂකයන් විසින් විශ්ලේෂණය කර ඇත. එබැවින් මෙම

ප්‍රශ්නය හුදෙක්ම විවෘත සෙනාරියක් නොව ඉතා සංකීර්ණ විරුද්ධාභාසයක් ලෙස හුවා දැක්වීම වරදක් නොවේ. මෙම සියලු කරුණු සමස්ථයක් ලෙස සැලකූ විට ලෝකයේ අද නාවිකයන්පුහුණු කිරීම සඳහා මතු වී ඇති ගැටළු තේරුම් ගැනීම ඒ තරම් අපහසු නොවේ.

දැනටමත් ලෝකයේ නාවික නිලධාරීන් බඳවා ගැනීමේ ගැටළු පැන නැගී ඇත. එය තව දුරටත් දරුණු ලෙස බලපානු ඇති බවට අනාවැකි පළවේ. සමුද්‍ර ප්‍රතිපත්ති පර්යේෂණ පදනම (1) පවසන අන්දමට වසර 2050 වන විට නාවිකයන්ගේ හිඟය 364,000 දක්වා වැඩිවීමට නියමිතය. මෙයින් වැඩිම බලපෑම ඇත්තේ නාවික නිලධාරීන් සඳහාය. එබැවින් එය දැනට ලෝකයේ ව්‍යාප්ත ප්‍රශ්නයක් ලෙස නාවික කර්මාන්තය තුළ හඳුනාගෙන ඇත.

## 3. <u>නාවික කර්මාන්තය</u>

මෙම වාතාවරණය අනුව නාවික අධ්‍යාපන හා පුහුණු කිරීම් ක්ෂේත්‍රය තුළ දැනට පවතින හා ඉදිරියේදී බැරෑරුම් වන බවට පුරෝකථනය කර ඇති ගැටළු ඉතා සාවදානව සලකා බැලීම අත්‍යවශ්‍යය. මෙම තත්වය ගැඹුරින් සලකා බලන විට නාවික නිලධාරීන්ගේ ප්‍රභේදයේ පවතින සංකීර්ණ තත්වය විද්‍යාමාන වේ. එනම් පුහුණු නිලධාරීන්ගේ හා ආධුනික නිලධාරීන්ගේ ප්‍රශ්නවල ඇති විෂමතාවයයි. 2009 වසරේ ලෝකයේ ඇති වූ ආර්ථික පරිහානියට සමගාමීව හා ඊට අනුරූපව නාවික ක්ෂේත්‍රය ද සැලකිය යුතු කඩා වැටීමක් සිදු විය. මෙය න්‍යායාත්මකව පැහැදිළි කළ හැකි සාමාන්‍ය තත්වයකි. ප්‍රවාහනය, විශේෂයෙන්ම නැව් මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම ආර්ථික විද්‍යා විෂයානුබද්ධව සාමාන්‍යයෙන් විග්‍රහ වන “ඉල්ලුම” මඟින් පැහැදිළි කිරීම අපහසුය. මන්ද යත් නැව් මඟින් භාණ්ඩ ප්‍රවාහනය නොහොත් නැව් ඉඩ සඳහා ඇති ඉල්ලුම න්‍යායාත්මකව ව්‍යුත්පන්න ඉල්ලුමක් (Derived Demand) ලෙස සැලකේ. මෙහි දාම ප්‍රතිඵලයක් ලෙස නැව් සමාගම්වලට අනපේක්ෂිත ඉල්ලුම පහත වැටීම සිදු වූ අතර ආධුනික නිලධාරීන් බඳවා ගැනීම නොසිතූ විරූ පරිදි කඩා වැටුණි. එහි අතුරු ප්‍රතිඵලයක් වූයේ නිලධාරීන් පුහුණු කරන ආයතන ඉතා අසීරු තත්වයකට පත්වීමයි. පුහුණුව ලැබූ නාවිකයන්ට පුහුණුවෙන් පසු ආදායම් මාර්ගයක් නොමැති වීම ඉතා භයානක තත්වයකි. මන්ද යත් ඒ සඳහා වැය කල යුතු මුදල් කන්දරාව බොහෝ පවුල් වලට මෙම ප්‍රමාදය මත දරා ගැනීමට නොහැකි වීමයි. මෙම තත්වයේ අනෙක් යතාර්ථය නම් නාවික නිලධාරී පුහුණුව ලැබූ ආධුනික සිසුවෙකුට එම සුදුසුකම මත වෙනත් රැකියා සඳහා ඇති අවස්ථා විරල වීමය. අනෙකුත් රැකියා පුහුණු වීම් මෙන් නොව නාවික පුහුණුව ලබන ශිෂ්‍යයන්ට ඇති ප්‍රධානම ගැටලුව වන්නේද මෙම නොපැහැදිළි තත්වයයි.

## 4. <u>නාවික මානව සම්පත් පසුබිම</u>

නාවික අධ්‍යයන හා පුහුණු කටයුතු අනෙකුත් අධ්‍යයන අංශ වලට වඩා බෙහෙවින් වෙනස් වන්නේ ඒ සඳහා අවශ්‍ය කරන මූලික ආයෝජන හැකියාව මතය. ඒ අනුව ලෝකයේ රටවල් අතර මෙම කාර්යය ඉටු කරන ක්‍රමවේදයේ විශාල පරතරයක් දැකිය හැකිය. BIMCO ආයතනය පවසන ආකාරයට වසර 2015 වන විට ලෝකයේ 1,647,500 ප්‍රමාණයක නාවිකයින් සිට ඇත. මෙයින් 774,000ක් නාවික නිලධරයන් වන අතර 873,500 සෙසු නිලයන්ය (Ratings). එහෙත් තක්සේරු කළ වාර්තා වලට අනුව ලෝකයේ දැනට ඇති ඉල්ලුම වන්නේ 1,545,000 කි. මේ සංඛ්‍යාව සෑදී ඇත්තේ 790,500 සෙසු නිලයන් (Ratings)ගේ සංකලනයක් ලෙසය. මෙයින් ගම්‍ය වන ප්‍රධාන කරුණ නම් මෙම ඌණතාව පවතින්නේ නාවික නිලධරයන් සඳහා මිස සෙසු නිලයන් සඳහා නොවන බවය. උදාහරණයක් ලෙස 2015 වසරේ නාවික නිල 2.1% හිඟයක් පැවතී ඇති අතර සෙසු නිලයන් 15.5% අතිරික්තයක් තිබී ඇත.

